# <u>ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය පොදු කොන්දේසි හා නියමයන්</u>

1) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ව්‍යාපාරිකයන් විය යුතුය.(සැපයුම්කරුවන් ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ ලේඛණ මගින් ලියාපදිංචිය තහවුරු කළ යුතුය. කොන්ත්‍රාත්කරුවන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචිය තහවුරු කළ යුතුය. එසේ නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. )

2) සියළුම අයදුම්කරුවන් මෙම දෙපාර්තමේන්තුවේ සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලෙස ලියාපදිංචි වීමට අයදුම් කල යුත්තේ මෙම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන අයදුම්පත්‍රවල පමණි.

3) කොන්ත්‍රාත්කරුවන් හා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත් හා ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය පොදු කොන්දේසි හා නියමයන් පුවත්පත් නිවේදනයේ පිටපතක් සමග පුවත්පත් නිවේදනයේ අංක 03 (v) ඡේදයේ සඳහන් කාර්යාලයන්හි දී 2024.10.21 දින සිට 2024.11.30 වන දින දක්වා පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා පමණක් රජයේ කාර්යාල දිනවලදී ලබා ගත හැකි අතර ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.botanicgardens.gov.lk) අයදුම්පත්‍ර භාගත කල හැක. අයදුම්පත්‍ර වෙබ් අඩවියෙන් හැර පුවත්පත් නිවේදනයේ අංක 03 (v) ඡේදයේ සඳහන් කාර්යාල වලින් මිලදී ගන්නේ නම් පහත 04 හි ලියාපදිංචි ගාස්තුවට අමතරව අයදුම්පත්‍ර ගාස්තු ලෙස රු. 2,000.00 ක මුදලක් ගෙවිය යුතුය. එය පිටපත් කර ගැනීම සම්බන්ධ කිසිදු බාධාවක් නොවේ.

4) සැපයුම්කරුවන් ලියාපදිංචිය සඳහා ආපසු නොගෙවන රු.1,000.00 ක මුදලක් (එක් කාණ්ඩයක් සඳහා) අය කරනු ලබන අතර කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය සඳහා ආපසු නොගෙවන රු.2,000.00 ක මුදලක් අයකරනු ලැබේ. මෙම අයදුම්පත්‍ර ගාස්තු මුදලින් පමණක් පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ පිහිටි ප්‍රධාන කාර්යාලයෙන් හා පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය, හක්ගල, ගම්පහ, ගනේවත්ත, මීගලෑව, හම්බන්තොට (මිරිජ්ජවිල) හා අවිස්සාවේල්ල (ඉළුක්ඔවිට) පිහිටි උද්භිද උද්‍යාන කාර්යාලයන්ගෙන් ද, නාරාහේන්පිට පිහිටි සහකාර අධ්‍යක්ෂ කාර්යාලය, අංක 43, කිරිමණ්ඩල මාවත, නාරාහේන්පිට, කොළඹ 05 යන ස්ථානයෙන් ද ගෙවීමට හැකි අතර ඒ වෙනුවෙන් නිකුත් කරන පොදු 172 රිසිට්පත්‍රයේ මුල් පිටපත අයදුම්පතට අමුණා එවීම අනිවාර්ය වේ.

5) එමෙන්ම ලංකා බැංකුවේ පේරාදෙණිය ශාඛාවේ 7040100 දරණ ගිණුම් අංකයට ඍජුව තැන්පත් කිරීමෙන් ලබා ගන්නා ලදුපත හෝ විද්‍යුත් පිටපත අයදුම් පත්‍රය සමඟ අමුණා එවීම ද කළ හැක. නමුත් මෙහිදී අදාල ලියාපදිංචිය ඉල්ලුම් කරන ක්ෂේත්‍රයේ අංකය සමඟ ඔබගේ ආයතනයේ නම හා ලිපිනය ලදුපතේ නිවැරදිව සඳහන් කලයුතු අතර ලදුපතේ "තැන්පතුවේ අවශ්‍යතාවය" ස්ථානයේ " සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය 2025" ලෙසද සඳහන් කිරීම මගින් බැංකු ගිණුම් විස්තරයේ අදාල තොරතුරු නිවැරදිව හා පැහැදිලිව සටහන් විය යුතුය. එබැවින් ඍජුව බැංකුව වෙත තැන්පත් කිරීමේ දී අදාල තොරතුරු නිවැරදිව සඳහන් නොවීම මත ඔබගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වීම වලක්වා ගැනීමට අයදුම්කරුවන් වගබලා ගත යුතුය.

6) එක් කාණ්ඩයකට වැඩි කාණ්ඩ ප්‍රමාණයක් සඳහා ලියාපදිංචි වීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා වෙන වෙනම අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එක් කාණ්ඩයක් තුළ අයිතම කිපයක් සඳහා එකම අයදුම්පත්‍රයක් මගින් ලියාපදිංචි විය හැකිය.

7) අයදුම්පත් සම්පූර්ණ කර රබර් මුද්‍රාව යොදා අත්සන් කළ යුතුය. අයදුම්පත් <u>තැපැලෙන් පමණක්</u> 2024.11.30 දින ප.ව 3.00 ට පෙර අධ්‍යක්ෂ ජනරාල්, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, තැ.පෙ.14,පේරාදෙණිය යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ සැපයුම්කරුවන් විසින් "සැපයුම්කරුවන් ලියාපදිංචිය -2025" ලෙස ද කොන්ත්‍රාත්කරුවන් විසින් "කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය -2025" යනුවෙන් සඳහන් කළ යුතුවේ.

8) මිල ගණන් සඳහා ලංසු ආරාධනා යොමු කල පසු ඒ සඳහා තෙවරක් (03වරක්) ප්‍රතිචාර නොදැක්වීම, අසත්‍ය තොරතුරු ලේඛන ඉදිරිපත් කිරීම, ඉල්ලුම්කරන ලද සැපයුම් සේවා හා ඉදිකිරීම් නිසි වේලාවට ඉටු නොකිරීම යන හේතූන් මත පූර්ව දැනුම් දීමකින් තොරව සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලේඛනයෙන් ඉවත්කිරීමේ බලය දෙපාර්තමේන්තුව සතු වන අතර මිල ගණන් ඉදිරිපත් කල නොහැකි නම් ඒ බව ලිඛිත ව දැන්විය යුතුය.

9) හදිසි අවශ්‍යතාවය මත ලියාපදිංචි නොකළ සැපයුම්කරුවන්ගෙන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් වුව ද මිළ ගණන් කැඳවීමට බලය මා වෙත (අධ්‍යක්ෂ ජනරාල්) ඇත.

10) දෙපාර්තමේන්තුව විසින් ඇණවුම් කරනු ලබන සියළුම භාණ්ඩ හා සේවා (නිසි පිරිවිතර වලට අනුව) සැපයූ පසුව සැපයුම්කරු විසින් ආයතනයන් වෙත ඉදිරිපත් කරන බිල්පත් වලට දින 30 ක් ඇතුලත දී ගෙවීම් කිරීමට කටයුතු කරනු ලැබේ.

11) ලියාපදිංචි කරනු ලබන සියලුම පුද්ගලයින් හෝ ආයතන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පනවා ඇති සියලු බදු හා එකතු කල අගය මත බද්ද (වැට්), මුද්දර බද්ද හා වෙනත් බදු පිළිබඳව කොන්දේසිවලට ද යටත් වේ. වැට් බදු සඳහා දැනටමත් ලියාපදිංචි වී ඇති අයදුම්කරුවන් ලියාපදිංචි වැට් බදු අංකය ඒ සඳහා ඉඩ තබා ඇති ස්ථානයේ සඳහන් කළ යුතුය.

12) එක් එක් අයදුම්පත්‍රය ඇගයීමට ලක් කරන අතර, දෙපාර්තමේන්තුව තීරණය කරන පරිදි සතුටුදායක අයදුම්කරුවන් පමණක් සැපයුම්කරුවන් /කොන්ත්‍රාත්කරුවන් ලෙස ලියාපදිංචි කරගනු ලැබේ. වැඩිමනක් විස්තර අවශ්‍ය වන්නේ නම් 081-2388654 දුරකථන අංකය මගින් මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී ඇමතීමෙන් ලබා ගත හැකිය. අයදුම්පත් නිකුත් කිරීම හා භාරගැනීම 2024.11.30 වන දින ප.ව 3.00 න් අවසන් වේ.

අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
පේරාදෙණිය.